මාධ්‍ය නිවේදන අංක **23**

මැතිවරණ කොමිෂන් සභාව

මාධ්‍ය නිවේදනය

## 2021.09.17 දින රැස්වූ මැතිවරණ කොමිෂන් සභාවේ තීරණ

- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99අ ව්‍යවස්ථාව යටතේ ශ්‍රී ලංකා පොදුජන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් තෝරා පත්කර ගන්නා ලද ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ අජිත් නිවාඩ් කබ්රාල් මහතා ඉල්ලා අස්වීම හේතුකොටගෙන පුරප්පාඩු වී ඇති මන්ත්‍රී ධුරය සඳහා 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 64(5) වගන්තිය ප්‍රකාරව කැටගොඩ ගමගේ ජයන්ත පෙරේරා මහතා තෝරාපත්කර ගැනීමට අදාළ අති විශෙෂ ගැසට් නිවේදනය නිකුත් කිරීම.

- පසුගිය පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ දී මොණරාගල ප්‍රාදේශීය සභාවේ මදුරුකැටිය කොට්ඨාසයේ ඡන්ද අපේක්ෂකයකු ඡන්ද දායකයින්ට ඡන්ද ආයාචනය කරමින් ද්‍රව්‍ය හා මුදල් ආධාර බෙදා දීමට එරෙහිව මොණරාගල මහාධිකරණයේ පවරන ලද අංක HC/01/2018 දරන නඩුවේ තීන්දුව ප්‍රකාශයට පත්කොට ඇත. එම තීන්දුව මගින් මෙවැනි ආකාරයෙන් අල්ලස් ලබාදීම ද, සභික ධුරය අහිමි වීමට හේතුවන මැතිවරණ වරදක් බවට තවදුරටත් තහවුරු කර ඇත. එම නඩු තීන්දුව පිළිබඳව අභියාචනා කිරීමේ කාලයෙන් පසුව හෝ අභියාචනාධිකරණයේ තීන්දුවකින් හෝ පසුව සුදුසු තීරණයක් ගැනීමට මැතිවරණ කොමිෂන් සභාව අපේක්ෂා කරන අතර, කෙසේ වෙතත් මෙම තීන්දුව මගින් මැතිවරණ කොමිෂන් සභාව නිරන්තරයෙන් ඉල්ලා සිටිනු ලබන මැතිවරණ ප්‍රචාරක වියදම් (Campaign Finance) පාලනය කිරීමේ මහජන අවශ්‍යතාව දැඩි ලෙස මතුව තිබේ.

- බන්ධනාගාර කළමනාකරණ හා සිරකරු පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍යවරයා විසින් වැලිකඩ හා අනුරාධපුර බන්ධනාගාරවලට ගොස් සිදුකරන ලද ක්‍රියාවන් හා සිරකරුවන්ට බලපෑම් කිරීම, සිරකරුවන්ගේ ජීවිත ආරක්ෂාව පිළිබඳ ගැටළුවක් හා මානව හිමිකම් උල්ලංඝනය කිරීමක් පමණක් නොව නීතියේ ආධිපත්‍යයට කරන ලද අභියෝගයක් මෙන්ම මහජන නියෝජිතයන් කෙරෙහි මහජන විශ්වාසය බිඳ හෙළීමට හා ඒ මගින් ප්‍රජාතන්ත්‍රවාදය හා නිදහස් හා සාධාරණ මැතිවරණ මගින් බලාපොරොත්තු වන ප්‍රතිඵලය කුමක් ද යන්න පවා ජනතා සැක සංකා ඇතිවීමට හේතුවක් විය හැකි බව මැතිවරණ කොමිෂන් සභාවේ අදහස වේ. එබැවින් මහජන නියෝජිතයින්ගේ ජනතා විශ්වාසය තහවුරු කිරීම සඳහා මෙ පිළිබඳව සුදුසු පියවර ගැනීමට ක්‍රියා කරන ලෙස ගරු කථානායකතුමාගෙන් ඉල්ලා සිටීමට මැතිවරණ කොමිෂන් සභාව තීරණය කරන ලදී.

නිමල් පුංචිහේවා
සභාපති
මැතිවරණ කොමිෂන් සභාව


මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.


2021 සැප්තැම්බර් මස 17